# ශ්‍රී ලංකාවේ බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය

පියදාස රණසිංහ[1]

## හැඳින්වීම

අතින් ලියන ලද සියලු ම ආකාරයේ ප්‍රලේඛන අත්පිටපත් ලෙස හැඳින්විය හැකි නමුදු පොදු ව්‍යවහාරයේ දී අත් පිටපත් ලෙස සලකනු ලබන්නේ නම්‍යශීලී හා පහසුවෙන් හැසිරවිය හැකි මාධ්‍යයක අතින් ලියනු ලබන හෝ පිටපත් කරනු ලබන ලේඛනයන් ය. නිදසුනක් සේ ගත හොත් ගස් පොතු, රෙදි, තුනී ලෝහ තහඩු (රන්, රිදී, තඹපත් ආදිය), වෙලම්, පාච්මන්ට්, තල්පත් හෙවත් පුස්කොළ, කඩදාසි ආදියේ ලියන ලද ලේඛනයන් ය. කෙසේ වෙතත් සෙල් ලිපි හා මැටි පුවරු ආදී අනම්‍ය ලේඛන මාධ්‍ය අත්පිටපත් යන පදයෙන් ආවරණය නොවන බවක් මින් අදහස් නො කැරේ.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශාසන භාරය දැරූ මහ තෙරුන් වහන්සේලා මුහුණ දුන් බලවත් ම අභියෝගය වූයේ බුදු හිමියන් විසින් ධරමාණ කාලයෙහි දේශිත විවිධ ධර්ම කොට්ඨාස ක්‍රමවත් ව රාශිගත කිරීමත්, බුද්ධ වචනය නො වෙනස්ව පවත්වා ගැනීමත් ය.

මේ අරමුණ ඇතිව බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් තුනක පමණ කාලයක් තුළ දී ධර්ම සංගායනා තුනක් පවත්වන ලදි. බුද්ධ වචනය ත්‍රිපිටකයක් වශයෙන් සංවිධාන ගත වූයේ තෘතීය සංගායනාවේ දී ය.

බුද්ධ වචනය එපරිද්දෙන් ම පවත්වා ගැනීම පිණිස ආරම්භක අවධියේ දී වාචනා මාර්ගය තෝරාගනු ලැබූව ද, පශ්චාත් කාලීනව බුද්ධ ධර්මය වෙනත් රටවලට ද පැතිරී ගිය හෙයින්, ඒ ඒ රටවල පැවති සාමාජික, දේශපාලනික හා පාරිසරික තත්ත්වයන් මත වාචනා මාර්ගයෙහිම රැඳී සිටීම නුවණට හුරු නොවන බවත්, එය ලේඛනාරූඪ කිරීම ආවශ්‍යක කාරණයක් බවත් ශාසන භාරධාරීන්ට ප්‍රත්‍යක්ෂ විය. එහෙයින් ක්‍රිස්තු පූර්ව තුන්වන සියවස වන විට බුද්ධ වචනය ලේඛන ගත කිරීම සිදු වූ බව පෙනේ. ප්‍රතිගෘහිත මතය අනුව ශ්‍රී ලංකාවේ, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ මාතලේ අලුවිහාරයේ දී ය. මීට සමගාමීව, ශ්‍රී ලංකාවට සැතපුම් දෙදහසක් පමණ දුර පිහිටි ගන්ධාර දේශයේ දී ද (වත්මන් බටහිර පාකිස්ථානය හා නැගෙනහිර ඇෆ්ගනිස්ථානය) බුද්ධ වචනය ග්‍රන්ථාරූඪ කිරීම, සිදු වූ බව සිහිපත් කළ යුත්තේ, ඒ කාර්යය යුගයේ අවශ්‍යතාවක් ලෙස බෞද්ධ ලෝකය විසින් පිළිගත් පොදු මතයක් වූ බවක් පෙනෙන හෙයිනි. එහෙයින් තත්කාලීන ශ්‍රී ලංකාවේ පමණක් නොව වෙනත් බෞද්ධ රටවල ද බෞද්ධ

---

1 ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

BHIKSHU UNIVERSITY OF SRI
07 APR 2015
LIBRARY

අත්පිටපත් සම්ප්‍රදායන් ආරම්භ වූ බව කිව හැකි ය. කෙසේ වෙතත් මෙකී බෞද්ධ අත්පිටපත් සම්ප්‍රදාය පසු කාලීනව යථා විධීන් පෝෂණය වූයේ ශ්‍රී ලංකාවේ පමණි.

මෙකී අත්පිටපත් සම්ප්‍රදාය පසුකාලීනව වර්ධනය වූ ආකාරය විමසා බැලීමේ දී පැහැදිළිව පෙනී යන කරුණක් නම් බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය යනුවෙන් නම් කොට හැඳින්විය හැකි සුවිශේෂී අත්පිටපත් සංස්කෘතියක් මෙරට ස්ථාපිත වූ බව ය. මේ පර්යේෂණයේ අරමුණ වූයේ යථෝක්ත බෞද්ධ අත්පිටපත් සංස්කෘතියට ආවේණික විශේෂතා වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීම යි.

## ක්‍රමවේදය

පාලි හා සිංහල සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනයෙන් මෙන්ම විවිධ වර්ගවල බෞද්ධ අත්පිටපත් නිරීක්ෂණයෙන් හා අධ්‍යයනයෙන් ද, සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් රචිත ද්විතීයික සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයෙන් ද, අත්පිටපත් සංස්කෘතිය පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් සහිත පුද්ගල මූලාශ්‍රය ආශ්‍රයෙන් ද පර්යේෂණ දත්ත සපයා ගැනිණි.

## සාකච්ඡාව

මෙරට බෞද්ධ අත්පිටපත්හි රචනා මාධ්‍යය වූයේ තල්පත් ය. හෙවත් පුස්කොළය. ලියන ලද පුස්කොළ, ග්‍රන්ථ වශයෙන් බැඳ සකස් කර ගැනීමෙන් පුස්කොළ පොත් නිර්මාණය කැරිණි.

ශ්‍රී ලංකාවේ බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය ආරම්භ වූයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට බොහෝ කලකට පෙරය. හෙළ බසින් ලියවුණු අටුවා මිහිඳු මා හිමියන්ගේ කාලයේ සිට ම පැවතිණි. ඒවා පාදක කොට ගෙන බිහි වූ වෙනත් ග්‍රන්ථ ද තිබූ බවට සාධක එළැවිය හැකිය.

මෙරට බෞද්ධ අත්පිටපත් සංස්කෘතියට අයත්වන ග්‍රන්ථ මූලික කොටස් දෙකකට බෙදිය හැකිය.

1. ඍජු ධර්ම ග්‍රන්ථ (ත්‍රිපිටකය, අටුවා, පද ඇණුම්, විවරණ ආදිය.)
2. ධර්මය පාදක කොට ගෙන බිහි වූ වෙනත් ග්‍රන්ථ (සම්භාව්‍ය සිංහල සාහිත්‍ය ග්‍රන්ථ, වෙනත් විෂයයන් සම්බන්ධ ග්‍රන්ථ ආදිය.)

මෙයින් පළමු වර්ගයට අයත් අත්පිටපත්හි අන්තර්ගතය හැමවිටම ධර්ම කරුණුවලට ම සීමා වේ. ත්‍රිපිටකය, අට්ඨකථා, සන්න හා ගැටපද, පද ඇණුම්, ආදිය නිදසුන්ය.

දෙවැනි වර්ගයට වෛද්‍ය විද්‍යාව, යාතු කර්ම, ශිල්ප කර්මාන්ත, සාහිත්‍ය කෘති ආදිය ඇතුළත් කළ හැකිය.

ශ්‍රී ලංකාවේ අත්පිටපත් සම්ප්‍රදාය බෞද්ධ අත්පිටපත් සංස්කෘතියක් ලෙස හැඳින්විය හැක්කේ කරුණු කීපයක් නිසාය.

1. අත්පිටපත් නිර්මාණ ක්‍රියාවලිය බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු ව්‍රත චාරිත්‍රවලින් සමන්විත වීම.
2. අත්පිටපත්කරණය බෞද්ධ සංස්කෘතික ලක්ෂණවලින් සමන්විත වීම. (ග්‍රන්ථාරම්භය, සමාප්තිය හා ප්‍රාර්ථනා වාක්‍ය, රූප සටහන්)
3. අත් පිටපත්කරණයේ ප්‍රතිලාභ කුසල් දහමක් සේ සැලකීම.
4. අත් පිටපත්හි අන්තර්ගතය බුදු සමය හා සංස්කෘතිකය නො ඉක්මවා යාම.
5. ධර්මය පුද්ගලාරෝපණයෙන් බුද්ධ, සංඝ රත්නද්වය හා සමතුලිතකරණය කිරීමෙන් අත්පටපත් පූජාර්හ වස්තු බවට පත් කිරීම
6. අත්පිටපත්කරණය හා ප්‍රතිබද්ධ සියලු සමාජ සංස්කෘතිකාංග බෞද්ධ සංස්කෘතික ලක්ෂණ හා බද්ධව පැවතීම.

**නිගමන**

ශ්‍රී ලංකාවේ බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය ධර්ම ග්‍රන්ථවලට පමණක් සීමා නොවේ. සාහිත්‍ය ග්‍රන්ථ සම්ප්‍රදාය ද ඊට අයත්ය.

වෛද්‍ය, නක්‍ෂත්‍ර, යන්ත්‍ර මන්ත්‍ර හා යාතු කර්ම, ශිල්ප කර්මාන්ත පිළිබඳ අත්පිටපත් ද බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය නැමැති පුළුල් ක්ෂේත්‍රයෙන් බැහැර කළ නො හැකිය.

කිසියම් කෘතියක මුල් අත්පිටපත සොයාගත නො හැකි වුව ද එහි දනට හමුවන අත්පිටපත් අතර පෙළෙහි වෙනස්කම් පවත්නේ අල්ප වශයෙනි. (යුරෝපයේ අත්පිටපත් පිළිබඳ තත්ත්වය මීට වඩා වෙනස්ය).

ලේඛන කලාව වෘත්තියක් වශයෙන් සංවර්ධනය වී තිබූ අතර යුරෝපයේ මෙන්ම මෙරට ද විශේෂිත පුහුණුවක් ලද ලිපිකරුවන් සිටි බව පෙනේ. අත්පිටපත් ලේඛන කලාව සම්බන්ධ සියලු කරුණු බෞද්ධ සංස්කෘතිය නමැති පුළුල් පදනමෙහි පිහිටා වර්ධනය වූ බව පැහැදිලි ය.

විසිවැනි සියවසේ මුල් භාගය තෙක් බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය නො නැසී පැවතිණි. මුද්‍රණ යන්ත්‍රය නිසා අත්පිටපත් සම්ප්‍රදාය බිඳ වැටුණ ද, ආරම්භක යුගයේ මුද්‍රිත ග්‍රන්ථවල ද බෞද්ධ අත්පිටපත් සංස්කෘතියේ බලපෑම දක්නට ලැබේ.

බෞද්ධ අත්පිටපත් සංස්කෘතිය මෙරට බහු ජනතාවගේ සාමූහික චින්තනය තුළ කිඳා බැස තිබේ.